# ජනපතිවරණයට සරත් පොන්සේකා ඉදිරිපත්වෙයි?


සරත් පොන්සේකා මහතා

**ශ්‍රී**ලංකාවේ මීළහට පැවැත්වීමට නියමිත ජනපතිවරණයට රජයට එරෙහිව හිටපු හමුදාපති ජෙනරාල් සරත් පොන්සේකා මහතා ඉදිරිපත් වන බවට බොහෝ දූෂමාන ආරංචි ශ්‍රීලංකාවේද පිටරට වලද පැතිරයමින් පවතී. එසේ ඔහු ඉදිරිපත් වන්නේ නම් විපක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ ඔහුට සම්පූර්ණ සහයෝගය දෙන බවත්, ඔහු විපක්ෂයෙන් ඉදිරිපත් කරන පොදු අපේක්ෂකයා වශයෙන් නම්කරන බවත් ඇතැම් මාධ්‍යකරුවන් ලියා පළකර ඇත. මෙයටම සම්බන්ධ තවත් ආරංචි අතර, පොන්සේකා මහතා ද්‍රවිඩ සංධානයේ මන්ත්‍රීවරුන් සහ විපක්ෂනායක රනිල් වික්‍රමසිංහ මහතා හමුවී සාකච්ඡා කර ඇති බවත් ඇතැම් වෙබ් අඩවිවල පළවිය. එසේම ඔහු හිටපු ජනාධිපතිනිය චන්ද්‍රිකා මැතිනිය හමුවූ බවක්ද එක් ප්‍රවෘත්තියක වීය. මේ අතර රජයේ මැති ඇමතිවරුන් වන රාජිත සේනාරත්න සහ හේමකුමාර නානායක්කාර යන දෙදෙන සරත් පොන්සේකාට දොස් නගමින් යුද්ධය දිනුවේ ඔහු නොවන බවද කියමින් ඉතා අවිනීත ලෙස ලංකාවේ රූපවාහිනී මාධ්‍යයෙන් වාග් ප්‍රහාරයක යෙදුණු බව එය දුටු ලංකාවේ ජනතාව කියති. රජය හා පොන්සේකා මහතා අතර කිසියම් ඝට්ටනයක් පවතින බව දැන් ජනතාවට දැනී ඇත. මේ සියල්ල අතරේ සරත් පොන්සේකා මහතා තමා ජනපතිවරණයට ඉදිරිපත්වන බවක් කොතැනක වත් හරියටම කියා නැත. ඒ නිසා මේ පළවන පුවත් වල ඇත්ත නැත්ත කුමක්දැයි කිසිවෙක් නොදනිති. ඉදිරියට වන්නේ කුමක්දැයි දැනගත හැක්කේ ඉදිරිකාලයේදී පමණි. කෙසේ හෝ සරත් පොන්සේකා මෙසේ ඉදිරිපත් වන්නට යන බව ඇසීම රජය බිඳ දැමීමට එන හොඳ අවස්ථාවක් වශයෙන් ප්‍රතිගාමී බලවේග දැනටම සිතටගෙන හැම පැත්තෙන්ම ක්‍රියාත්මක වී සිටින බව නම් නිසැකවම කිව හැකි ය.

# රණවිරුවන් සිහිකෙරෙන නොවැම්බරයේ පොපි මල

**නො**වැම්බර් මාසය ළංවෙත්ම ලොව බොහෝ දෙනා තම ඇඳුමෙහි පළඳින කෘතිම මලක් වේ. එය පොපි **poppy** මලයි. රුධිර වර්ණයෙන් යුතු පොපි මල් පළඳ නාව බ්‍රිතාන්‍ය මහ රැජිණගේ පටන් සෑම තරාතිරමකම අයවළුන්ද, විශ්‍රාමලත් හමුදා සාමාජිකයන්ද පළඳින්නේ මියගිය යුද සෙබළුන් සිහිපත් කිරීම පිණිසය. ලෝක මහා යුද්ධ වලද ද, වෙනත් සන්නද්ධ අරගල වලදී ද මරණයට පත්වූ සොල්දා දුවන් සිහිපත් කර කෙරෙන ගෞරවාචාර පුද සත්කාරය පිළිබඳ ඉතිහාස ගත තොර තුරු ඉතා සංවේදීශීලී ය.

1914 ආරම්භවුණු පළමුවන ලෝක මහා යුද්ධයේදී බ්‍රිතාන්‍යය, කැනඩාව, ඇමරිකාව වැනි මිත්‍ර රටවල යුද බලඇණි කඳවුරු බැඳ සිටියේ බෙල්ජියමේ බටහිර පෙදෙසේ ෆ්ලාන්ඩර්ස් මිටියාවතේ ය.

1915 මාර්තු 3 වන දින අනපේක්ෂිත ලෙස මහා යුද ප්‍රහාරයකට ලක්වූ මෙම මිත්‍ර ජාති බලඇණිවල සාමාජිකයන් 65000 ක් පමණ ජීවිතක්ෂයට පත්වූ අතර එම පෙදෙසේ සියළු ගොඩනැගිලි, මාර්ග, පාලම් සහ තාවකාලික කඳවුරු සහ මුලින්ම විනාශ වී ෆ්ලාන්ඩර්ස් මිටියාවත මඩ ගොහොරුවක් බවට පත්විය. මෙහිදී දිවි බේරාගත් කැනඩාවේ 3 වන වෛද්‍ය බලකායේ වෛද්‍ය ලුතිනන් කර්නල් ජෝන් මැක්රේ ඇතුළු පිරිස වෙනත් ස්ථානයකට පසු බැසීමට පෙර තම සගයින් සදහටම වැළලුණු මිටියාවතට ගොස් නිහඬව යාඥාකරමින් අනුස්මරණය කළෝය. මිය ගිය සෙබළුන්ගේ සිරුරු වැළලුණු පෙදෙස්වල පස් හා මඩගොහොරු මතින් පිපී එන රතු පැහැති පොපි මල් ගැන කාගෙත් අවධානය යොමුවිය. කවියටද, සාහිත්‍යයටද ඇළුම් කළ වෛද්‍ය කර්නල් ලුතිනන් මැක්රේ මෙම පොපි මල්ද උපමා කරගනිමින් කාව්‍ය සංකල්පනාවක් තම දින පොතෙහි සටහන් කරගත්තේය. එම වසරේ දෙසැම්බර් 8 වෙනි දින නිකුත්වූ **Punch** සඟරාවට මෙම කාව්‍ය සංකල් පනාව වන **'In Flanders Field'** පළකරගැනීමට මැක්රේ සමත් වූ අතර එම කවි පංතිය යුද පෙරමුණේ සිටි සෙබළ සමූහයා අතරද බෙහෙවින් ජනප්‍රිය වීය.

1918 අග භාගයේ දී යුද්ධය හමාරකිරීම සඳහා වූ කටයුතු සිදුවෙමින් පවතින අතරතුර ඇමරිකාවේ යුද අනාථයන් පිළිබඳව කටයුතු කරන කාර්යාලයක සේවය කළ ඇමරිකානු ජාතික කාන්තාවක් වූ මොයිරා මිචෙල් (Moira Michel) ගේ අවධානයට ලක්වූ ඉහත කී කවි පන්තියට ඇය පිළිතුරු වශයෙන් **We shall keep the faith** යනුවෙන් කවි පෙළක් ලියා යුද්ධය නිසා අනාථ වූවන් අතරේ බෙදාහැරියා ය. එපමණක් ද නොව කෘතිම ලෙස සාදාගත් පොපි මලක් තම ඇඳුමේ පැළඳ ගැන්මට ඇය පුරුදු වූවා ය.

1918 නොවැම්බර් මස 11 වෙනි දින පෙරවරු 11 ට යුද්ධය නිමාකරලීමේ ගිවිසු මට අත්සන් තබන මොහොතේ තම කායාීලයට පැමිණි පිරිසට පොපි මලක් බැගින් බෙදා දී මියගිය යුද සෙබළුන් සිහිපත් කිරීමට මොයිරා ප්‍රමුඛ වූ බව සඳහන් වේ. මෙම කායාීලයට ප්‍රංශයේ සිට පැමිණ සිටි ප්‍රංශ ජාතික කාන්තාවක් වූ ඇනා ගූරියන් පොපිමල් අළෙවි කොට එමගින් ලබෙන ආදායම මියගිය සෙබළුන්ගේ පවුල් වල සුබසාධනය සඳහා යෙදවිය යුතුයයි යෝජනා කළා ය.

යුද්ධය නිමාවී වසරකට පසු එනම් 1919 නොවැම්බර් 11 වන දින බ්‍රිතාන්‍යයේ 5 වන ජෝර්ජ් රජුගේ ප්‍රධානත්වයෙන් පළමුවරට මියගිය සෙබළුන් සිහිපත් කිරීමේ දේව මෙහෙයක් පැවැත්වූ අතර ඉදිරි වර්ෂවලදී මෙම දේව මෙහෙයයන් සෑම නොවැම්බර් මසකම දෙවෙනි ඉරිදාට පැවැත්වීමට රජු නියම කළේය එයට හේතුව නොවැම්බර් 11 ට ආසන්නතම ඉරිදාවක් යොදා ගැන්මේ පහසුව තකා ය.

1921 වන විට අසරණ වූ පවුල් සඳහා කෙරෙන සුබසාධන කටයුතු වෙනුවෙන් අරමුදල් රැස්කිරීමේ ක්‍රියා මාර්ගයක් ලෙස කෘතිම පොපිමල් අළෙවිකිරීමට කටයුතු යෙදිණ. ප්‍රංශයේ ඇනා ගූරියන් විසින් පොපි මල් සාදා ප්‍රථම තොගය අලෙවිකිරීමට ලන්ඩන් නුවරට එවූ අතර, 1921 නොවැම් බර් 7 වෙනි දින පස්වන ජෝර්ජ් රජු විසින් ප්‍රථම පොපි මල මිළදී ගෙන පොපි මල් ව්‍යාපාරය ආරම්භ කරන ලදී.

එදා මෙදා තුර ලොව සියළුම රටවල



නොවැම්බර් මාසය එළඹෙත්ම පොපි මල් අලෙවිය ආරම්භ කොට එමගින් ලැබෙන ආදායම මියගිය සොල්දාදුවන්ගේ පවුල්වල සුබසාධනයට යොදා ගැණේ. ඊට සමගා-මීව ඔවුන් සිහිපත්කිරීම ද සිදුකෙරේ.

ශ්‍රීලංකාවේ ප්‍රධාන යුද ස්මාරකය පිහිටා ඇත්තේ කොළඹ විහාර මහාදේවි උද්‍යානයේ, මහජන පුස්තකාලයට යාබද-වය. පොපිමල් අලෙවිය සේවා මුක්ත භට සංගමය මගින් සිදුකෙරෙන අතර අනුස් මරණ පෙළපාලිය ශ්‍රීලංකා යුද, නාවික හා ගුවන් හමුදාවල මෙහෙයවීමෙන් සිදුකෙරේ.

පොපිමල් ව්‍යාපාරයට එරෙහිව සිදුකෙරුණු ව්‍යාපාරයක් පිළිබඳව අසන් නට ලැබෙන්නේ ශ්‍රීලංකාවේ දී පමණි. එය **සූරියමල් ව්‍යාපාරය** නමින් සුප්‍රසිද්ධ විය.

1935 වකවානුවේ අධිරාජ්‍ය විරෝධී සටන් වල නියැලී සිටි ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ ආදී වාමාංශිකනායකයෝ සූරියමල් ව්‍යාපාරයට නායකත්වය දුන්හ. ඔවුන්ගේ අදහස වූයේ අධිරාජ්‍යය ව්‍යාප්ත කරලීමේ යුද්ධවලින් මියගිය සෙබළුන් වෙනුවෙන් උපකාර කරනවාට වඩා තම රටේ මැලේරියා උවදුරෙන් මිය යන අයගේ පවුල්වල සුබසාධනය සඳහා ශ්‍රීලාංකික යින් දායක විය යුතු බවයි. ඒ සඳහා සූරිය මල් සාදා අලෙවිකිරීමේ ව්‍යාපාරයක් ඔවුන් ආරම්භ කළ අතර ඒ නිසාම එම වාමාං ශික නායකයින්ට හිරබත් කෑමට සිදුවිය.

අද පොපිමල් දිනයේ ලෝකය පුරා රටවල මියගිය රණවිරුවන් සිහිපත් කිරීම සිදුවේ. යුද්ධවලින් තොර ලෝකයක් කිසි දින වෙතියි සිතිය නොහැකිවන අතර යුද්ධ යක් ඇති වුවහොත් ඊට සිය ජීවිතය පුද-දෙමින් දේශයන් ආරක්ෂා කරන්නේ යුදභටයාය. යුද නැති සමයේ වුවද නිරන් තරයෙන් එම සෙබළා කළ මෙහෙය අප සිත්හි රඳවා තබාගත යුතුය. අප රටේ ද මෑතක නිමවූ දීර්ඝ ත්‍රස්තවාදී යුද්ධයේදී දිවි පිදූ ඒ අභීත රණවිරුවන් සිහිපත් කොට ඔවුන්ගේ පවුල්වල සුබසාධනය සැලසීම අප කාගේත් යුතුකමකි.

**ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී**

**♦ මේජර් වී. බී. කරුණාරත්න**

**Oxford UK**



## IN FLANDERS FIELDS

**by John McCrae**

In Flanders fields the poppies blow
Between the crosses, row on row,
That mark our place: and in the sky
The larks, still bravely singing, fly
Scarce heard amid the guns below.
We are the Dead. Short days ago
We lived, felt dawn, saw sunset glow,
Loved, and were loved, and now we lie
In Flanders fields.
Take up our quarrel with the foe:
To you from failing hands we throw
The torch; be yours to hold it high.
If ye break faith with us who die
WE SHALL NOT SLEEP,
THOUGH POPPIES GROW
IN FLANDERS FIELDS.




# බොර දියේ මාලු බෑම



**ඔ**ක්කොටම ඉස්සෙල්ලා මේ උපමාවෙ හැබෑ තේරුම කියන්නම්. හුඟ දෙනෙක් හරියට මේක දන්නෙ නැති නිසා.

වැස්සාම ගඟේ, ඇලේ, ඔයේ වතුර බොරවෙනවා. එතකොට වතුරෙ හිටපු මාළු කලබල වෙනවා. බොර වතුරෙ ඔක්සිජන් නැති නිසා මාළුවට හුස්ම ගන්න බෑ. එතකොට මාළු ගල්වලින් එළියට ඇවිල්ලා ඒ මේ අත දුවන්න පනින්න ගන්නවා. මේ වෙලේ වතුරට අතංගුවක් හරි, දැළක් හරි ගැහුවම අර මාළු ටික ඔක්කොම අල්ලගන්න පුළුවන්. බොරදියේ මාළුබාන්නෙ ඔය විදියට. වෙන විදියකට අර්ථකථනය කළොත් මෙහෙමයි. කිසි යම් කළබල අවාසනාවන්ත අවස්ථාවකදි ඒකෙන් අයුතු ප්‍රයෝජන ගන්න ඉදිරිපත්වීමත් බොරදියේ මාළුබෑමක් තමයි. ඉංග්‍රීසි යෙනුත් මේ යෙදුමම තියනවා. **Fishing in the troubled waters** කියලා. ඒකට දීලා තියන තේරුමත් මම ඉහළ දැක්වූ දේමයි. **Trying to take advantage of a confused situation.**

හොඳට තේරුම් යන උදාහරණයක් හැටියට දෙන්න පුළුවන් මේක. මරණේ ගෙවල්වල ගෙදර කස්ටිය අඬා වැලපෙන වෙලාවෙ එතන අඬ අඬ සෝක වෙවී හිටි හොරෙක් හෙමින් ගේ ඇතුළ් කාමරේට රිංගලා රත්තරන් බඩුයි සල්ලි අරන් මාරු වෙනවා. ව්‍යසනයක් දුකක් තමන්ගෙ වාසියට හරවා ගන්නවා.

හොඳට හිතලා බලන්න. දැන් ලංකාවෙ සිද්ධ වෙන්නෙත් හරියටම මේ බොර දියේ මාළු බෑම තමයි.

අපි කවදත් කිව්ව වගේ ප්‍රභාකරන් මැරුවයින් ත්‍රස්ත වාදෙවත් ශ්‍රීලංකාවෙ හතුරොවත් කාලකණ්නි ටිකවත් නැත්තටම නැතිවුණේ නැහැ. උන් නිශ්ශබ්දව හිටියෙ අවස්ථාවක් එනකල්. අවස්ථාවක් නාවත් හොඳට විපරමෙන් ඉඳලා සිද්ධවෙන දේවල් වලින් අවස්ථාවක් හදාගන්න හතුරට පුළුවන්.

කොටින්ට පක්ෂව ඉඳලා, යුද්ධෙ කවදාවත් ඉවරකරන්න බැහැයි කියපු නරුමයො හදිසියෙම ජනතා හිතවාදීන් වෙලා. ආණ්ඩුව ජයෙන් උදම්වෙද්දි මැති ඇමතිවරුන්ගෙ මූණු දාලා රට පුරාම කටවුට් ගහලා, මහ රජාණෙනි ආයුබෝවේවා කියලා ප්‍රශස්ති ගී ගායනා කරලා නග්ගලා තිබ්බාට දැන් ඒ සරුව පිත්තල බැබළීම මාස පහක් යනකොට බිංදුවට බැහැලා කියලා තේරෙනවා රටේ ජනතාවම කියන දේවල් වලින්. කාටත් දැන් අමතකයි ගිය අවුරුද්දෙ මේ කාලෙදිත් රටේ බෝම්බ පිපිරුණු වග. මිනිස්සු මැරිලා කඳාතීන් අඬා වැළපුණු වග. ඇම්බියුලන්ස් හඬ නගාගෙන තුවාල කාරයො පටවගෙන රෝහලට දිව්ව හැටි. රණවිරුවන් යුද්ධ භූමියේ ජීවිතේ දුන්න හැටි. මේ සේරම මාස පහකින් අමතක වුණා. කිලිනොච්චිය නෙවෙයි මැදවච්චියයි අලිමංකඩ නෙවෙයි පාමංකඩයි කියපු කස්ටිය දැන් කළ එළියට ඇවිත් ජනතාව බේරගන්න ලොකු ප්‍රෝග්‍රෑම් එකක් හදනවා. දැන් අන්න හතුරො ටික ඔක්කොම එක පැත්තකට ඇවිත් බොරදියේ මාළු බාන්න අතංගු, දැල්, බිලීපිති ලෑස්ති කරනවා. එන්ජීඕ සල්ලි වලින් යැපෙන නිදහස් මාධ්‍යකාරයො ටික වෙබ් සයිට් හදාගෙන දැන් ඉඳලාම වැඩට බැහැලා. දෙමළ සංධානෙ පෙඩරල්කාරයො, පිටරට කොටි ඩයස්පෝරාව, නෝර්වේ, ඇමරි කාව මේ සේරම කුම්භාණ්ඩයො හැත්ත තාප්පෙ ළඟටම ඇවිත් බලන් ඉන්නවා. අපෙන් මොනවද කෙරෙන්න ඕන අහනවා.

ඒ අතරෙ හතුරො හිතපු නැති චාන්ස් එකක් අත ළඟටම ආවා. ඒ තමයි ජෙනරාල් සරත් පොන්සේකා බොරවතුරට තල්ලුකරන්න ඉඩක් එන බව පෙනීම. හතුරො ටික පස්වනක් ප්‍රීතියෙන් පිනා ගිහිල්ලා, මෙන්න බොලේ නියම චාන්ස් එකක් කියලා. අපි වතුරට බහින් ඕන නෑ, වැඩේ නිකම්ම කෙරෙන පාටයි කියලා දැන් ලෑස්ති පිට හිනාවේවී බලන් ඉන්නවා.

මේ දේවල් මේ තරම් ඉක්මනට කණපිට හැරෙන්නට මූලික හේතුව තමයි ආණ්ඩුවෙ ඉන්න ගොබ්බ මැති ඇමතිවරුන්ගෙ ගොබ්බ වැඩ. උන්ගෙ උද්දච්ච කතා. යුද්ධෙ දිනපු වෙලාවෙ සරත් පොන්සේකා දෙවිකෙනෙක් ගණනට උස්සලා කතා කරපු ඒ ගොබ්බයො, මාස පහක් ගියේ නෑ, අද සරත් පොන්සේකාට පස්පඩංගුවෙ බණිනවා. මේ සේරම දේවල් ජනතාවගේ කල-කිරීමට හේතුවෙලා. හතුරන්ට තේරෙනවා මේ පහළවේගන එන්නෙ හොඳ ලකුණු බව. විශේෂයෙන් මේ හැමදේකම කෙළ වරේ ඉන්න දෙමළ ඊළාම් වාදය පණ ගහලා ආයිත් කරළියට එනවා. සිංහලයා එතකොට අවුරුදු 30 කට ඉස්සර අර පටන් ගත්තු තැනට ආයිත් වැටෙනවා. හැබැයි එතකොට එදාට රට බේරගන්න එතන තව සරත් පොන්සේකලා ඉන්න එකක් නෑ. ඒකයි මහත්තෙයො අපිට තියෙන කණගාටුව.

**♦ වෙලේගෙදර රාළ London**